# පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව

# 2011 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

## 01 හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද 13 වන ව්‍යවස්ථා සංශෝධනය අනුව අත්යන්ත්‍ර පේෂකර්මාන්තය සම්බන්ධ විෂය පළාත් සභා යටතට පැවරී ඇති විෂයකි. ඒ අනුව පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත්තේ එම විෂයට අදාළ ප්‍රතිපත්තිමය තීරණ හා මධ්‍යගත කටයුතු හා පළාත් සභා පේෂකර්මාන්ත අංශ සමග සම්බන්ධීකරණය තුලින් කර්මාන්තයේ දියුණුවට අදාළ සේවාවන් සැපයීමයි.

## 1.1 දැක්ම

දේශීය අනන්‍යතාවය සහ සංස්කෘතියට උචිත පරිදි මෙන්ම දේශීය හා විදේශීය වෙළඳපොල ක්‍රියාකාරීත්වය ජය ගත හැකි පරිදි අත්යන්ත්‍ර පේෂකර්ම ක්ෂේත්‍රයෙහි නිර්මාණශීලි සහ තරගකාරී රෙදිපිළි නිෂ්පාදනය සඳහා නිෂ්පාදකයින් යොමු කිරීම.

## 1.2 මෙහෙවර

රාජ්‍ය ප්‍රතිපත්ති රාමුව තුළ අත්යන්ත්‍ර පේෂකර්මාන්තය සංවර්ධනය සඳහා අදාළ ප්‍රතිපත්ති සකස් කිරීම. එකී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මග පෙන්වීම අවශ්‍ය සේවා හා පහසුකම් සැපයීම සහ මෙහෙයවීම හා සම්බන්ධීකරණය තුළින් අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ක්ෂේත්‍රය තුල ප්‍රමාණාත්මක හා ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම.

## 1.3 අරමුණු

01. අත්යන්ත්‍ර පේෂකර්මාන්තය සංවර්ධනය සඳහා අදාළ ප්‍රතිපත්ති සකස් කිරීම
02. නිෂ්පාදනය සංවර්ධනය අරමුණු කරගත් වැඩසටහන් සම්පාදනය කිරීම
    * ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන්
    * මෝස්තර සම්පාදන වැඩසටහන්
    * පුහුණුකරවන්නන් පුහුණු කිරීමේ වැඩසටහන්
03. අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ක්ෂේත්‍රයේ සංවර්ධනයට අවශ්‍ය උපදේශකයින් හා කාර්යමණ්ඩල පුහුණු කිරීම
04. ක්ෂේත්‍රයට අවශ්‍ය ශ්‍රමිකයින් පුහුණු කිරීම
05. අලෙවි ප්‍රවර්ධනය (දේශීය හා විදේශීය අලෙවි කටයුතු සංවිධානය කිරීම)
06. අත්යන්ත්‍ර පේෂකර්මාන්තය ව්‍යාප්ත කිරීම අරමුණු කරගත් සුදුසු ව්‍යාපෘති, ස්වයංරැකියා හා උපකාරක සේවා සැපයීම, වැඩසටහන් සංවිධානය කිරීම

07. අත්යන්ත්‍ර පේෂකර්මාන්තයේ මෝස්තර සංවර්ධන හා ගුණාත්මක වර්ධනය අරමුණු කරගත් ප්‍රදර්ශන හා තරග පැවැත්වීම

08. ජාතික අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ප්‍රදර්ශනය පැවැත්වීම

09. අත්යන්ත්‍ර පේෂකර්මාන්තය වර්ධනය සඳහා අවශ්‍ය පර්යේෂණ අත්හදා බැලීම් හා සංරක්ෂණ කටයුතු

10. නව තාක්ෂණය හඳුන්වාදීම හා අදාළ සංවර්ධන කටයුතු

උක්ත අරමුණු ඉටු කිරීම සඳහා පහත සඳහන් ආයතන මෙම දෙපාර්තමේන්තුව යටතේ දැනට ක්‍රියාත්මක වේ.

| | | |
|---|---|---|
| 01. | පර්යේෂණ සංවර්ධන හා පුහුණු ආයතනය කටුබැද්ද | -01 |
| 02. | පේෂකර්මාන්ත කෞතුකාගාරය , කටුබැද්ද | -01 |
| 03. | පේෂකර්මාන්ත පුහුණු පාසැල් | -13 |
| 04. | මෝස්තර පුහුණු පාසැල් | -01 |
| 05. | ස්වභාවික වර්ණ ව්‍යාපෘතිය - රාජගිරිය | -01 |

2011/12/31 දිනට දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය

| | |
|---|---|
| 1. පේෂකර්මාන්ත අධ්‍යක්ෂ | - 01 |
| 2. අනෙකුත් මාණ්ඩලික නිලධාරීන් | - 03 |
| 3. රාජ්‍ය කළමණාකරන සහකාර සේවයේ සහ අනෙකුත් කාර්ය මණ්ඩලය | - 19 |
| 4. දෙපාර්තමේන්තුගත කාර්ය මණ්ඩලය | - 88 |
| 5. සුළු සේවක කාර්ය මණ්ඩලය | - 37 |
| | 148 |

**<u>නව බඳවා ගැනීම් හා විශ්‍රාම ගැනීම්</u>**

2011 වර්ෂය තුළ පේෂකර්මාන්ත උපදේශිකා නව බඳවා ගැනීම් 06 ක් සිදු කර ඇති අතර නිලධාරීන් පහත සඳහන් පරිදි විශ්‍රාම ගොස් ඇත.

| | |
|---|---|
| ගණකාධිකාරී | - 01 |
| සංවර්ධන සහකාර | - 01 |
| රා.ක.ස.සේවය | - 01 |
| පේෂ උපදේශිකා | - 03 |
| චිත්‍ර ප්‍රදර්ශක | - 01 |
| මුරකරු | - 01 |

## 02 2011 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය

### 2.1 ප්‍රතිපාදන උපයෝජනය

2011 වර්ෂයේ සළසා තිබූ ප්‍රතිපාදන පහත පරිදි ප්‍රතිශතයන්ගෙන් උපයෝජනය කර තිබුණි.

- මුළු ශුද්ධ පුනරාවර්තන ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස මුළු උපයෝජනය 94%

  මුළු ශුද්ධ මූලධන ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස මුළු උපයෝජනය 84%

-

| වැය විෂය | | මුළු ශුද්ධ වෙන් කිරීම **(2011 වර්ෂය)** (රු:) | මුළු වියදම (රු:) | ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ඉක්මවීම (රු:) | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| | <u>පුනරාවර්තන වියදම්</u> | | | | |
| 1001 | පුද්ගල පඩිනඩි | 46,350,000 | 42,825,782 | 3,524,218 | 92% |
| 1002 | | | | | |
| 1003 | | | | | |
| | අනෙකුත් පුනරාවර්තන වියදම් | 13,273,000 | 13,162,108 | 110,892 | 99% |
| | | | | | |
| | <u>මූලධන වියදම්</u> | | | | |
| 2001 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 4,900,000 | 1,834,382 | 3,065,618 | 37% |
| 2003 | වාහන | 1,000,000 | 968,370 | 31,630 | 97% |
| 2102 | ගෘහ භාණ්ඩ සහ කාර්යාලයීය උපකරණ | 900,000 | 899,936 | 64 | 100% |
| 2401 | පුහුණුකිරීම් සහ හැකියා වර්ධනය | 17,300,000 | 16,587,312 | 712,688 | 96% |

## **2.2** <u>ආදායම් ගිණුම්</u>

පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව සේවා සපයන ආයතනයක් බැවින් විශේෂ ආදායම් නොමැත.

## **2.3** <u>රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී " ගිණුමේ කාර්යසාධනය</u>

| | උපරිම හර සීමාව | අවම ලැබීම් සීමාව | උපරිම හර ශේෂ සීමාව |
|---|---|---|---|
| | රු: | රු: | රු: |
| වාර්ෂික විසර්ජන ගිණුමේ සීමාවන් | 7,400,000 | 3,200,000 | 32,200,000 |
| වාර්ෂික සත්‍ය වියදම | 4,033,391 | 5,421,688 | 19,266,104 |

## 3. වාර්ෂික කාර්යසාධනය

| | වාර්ෂික සැළැස්ම අනුව ඉලක්කගත ප්‍රමාණය | තත්‍ය ප්‍රගතිය |
|---|---|---|
| 3.1 පේෂකර්මාන්ත ආයතනයේ ප්‍රධාන කාර්යාලයේ කාමර වෙන් කිරීම, කටුබැද්ද පර්යේෂණ, පුහුණු, මෝස්තර හා සේවා ආයතනය අලුත්වැඩියා කිරීම හා පේෂ පාසල් අලුත්වැඩියා කිරීම | ආයතන 15 කි | ආයතන 10 කි |

**3.2 බලවේග අංශය සම්බන්ධ කටයුතු**

දෙපාර්තමේන්තුව සතුව තිබී පෞද්ගලික අංශයට විකුණනු ලැබ ඇති බලවේග ආයතන සම්බන්ධයෙන් වන කටයුතු හා එම ආයතනවල සිට රැකියා අහිමි වූ විශ්‍රාම වැටුප් හා වන්දි ඉල්ලීම් ඉදිරිපත් කරනු ලබන නිලධාරීන් සම්බන්ධයෙන් කටයුතු කිරීම මෙම අංශයෙන් සිදු වේ.

1980/81/82 පෞද්ගලික අංශයට පවරන ලද පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවට අයත් බලවේග ව්‍යාපාරවල සේවය කරන වසර 10ට අඩු සේවකයන් සඳහා වන්දි මුදලක් ප්‍රදානය කිරීම සඳහා 2011-04-11 දින පුවත්පත් දැන්වීමක් පළ කරන ලදි. ඒ සඳහා අයදුම්පත්‍ර 5000කට වැඩි ප්‍රමාණයක් ලැබුණු අතර එම අයදුම්පත්‍ර පරීක්ෂා කර අදාළ බලවේග ව්‍යාපාර වලට ලේඛනගත කිරීම හා ඔවුන්ට වන්දි ලබා දීම සඳහා අවශ්‍ය තොරතුරු අමාත්‍යංශය වෙත යොමු කරන ලදි.

**3.3 පේෂකර්මාන්ත පුහුණු ව්‍යාපෘති**

* පේෂකර්මාන්ත පුහුණු පාසැල් වලට සිසුන් බඳවා ගෙන පුහුණු කිරීම

පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක පේෂකර්මාන්ත පුහුණු පාසැල් 13 ක් මගින් පේෂකර්මාන්තය පිළිබඳ මූලික පුහුණු පාඨමාලාව හා දෑඅවුරුදු පුහුණු පාඨමාලාව තුලින් අදාළ පුහුණුව ලබා දෙයි.

පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ ක්‍රියාත්මක පේෂකර්මාන්ත පුහුණු පාසල්

I. වටපුළුව පෙහෙකම් සිප් පියස
II. බණ්ඩාරවෙල පෙහෙකම් සිප් පියස
III. ශාන්තිපුර පෙහෙකම් සිප් පියස
IV. මාතලේ පෙහෙකම් සිප් පියස
V. මාතර පෙහෙකම් සිප් පියස
VI. කිරම පෙහෙකම් සිප් පියස
VII. පින්නවල පෙහෙකම් සිප් පියස
VIII. බෝයගනේ පෙහෙකම් සිප් පියස
IX. හිරමඩගම පෙහෙකම් සිප් පියස
X. ගැටඹේ පෙහෙකම් සිප් පියස
XI. කටුබැද්ද පෙහෙකම් සිප් පියස
XII. නල්ලූර් පෙහෙකම් සිප් පියස
XIII. සමන්තුරේ පෙහෙකම් සිප් පියස
XIV. මෝස්තර පුහුණු පාසල, කටුබැද්ද

පේෂ පාසල් සඳහා 2011/2012 වර්ෂය වෙනුවෙන් සිසුන් 200ක් බඳවා ගැනීමට වාර්ෂිකව ඉලක්ක කර ගෙන තිබූ අතර බඳවා ගත් නවක සිසුන් ප්‍රමාණය 156 කි.

**4 අත්යන්ත්‍ර පේෂකර්මාන්ත අලෙවි ප්‍රවර්ධන වැඩසටහන්**

* දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනය

  2011 පෙබරවාරි මස බුත්තල පවත්වන ලද දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනයේ දී අත්යන්ත්‍ර පේෂකර්මාන්ත නිර්මාණ ඇතුලත් ප්‍රදර්ශන කුටියක් පැවැත්විනි.

* අත්යන්ත්‍ර රෙදිපිළි අලෙවි සල්පිල පැවැත්වීම

  ශ්‍රී ලංකාවේ අත්යන්ත්‍ර රෙදිපිළි සඳහා වැඩි ඉල්ලුමක් ඇති කිරිමත් ජනතාව අතර අත්යන්ත්‍ර රෙදිපිළි ජනප්‍රිය කිරීමත් අරමුණු කර ජාතික අත්යන්ත්‍ර රෙදිපිළි ප්‍රදර්ශනයට පූර්වගාමීව අලෙවි සල්පිල 2011 සැප්තැම්බර් මස 01,02,03 යන දිනයන්හි ජුබිලි ශාලාවේ දී පවත්වන ලදි.

* අත්යන්ත්‍ර පේෂකර්මාන්තයට අදාළ ගැටළු සඳහා විසඳුම් දීමේ පියවර ගැනීමට අදාළව සහ පළාත් සභාව සහ මධ්‍යම රජය අතර මනා සම්බන්ධතාවය වර්ධනය කර ගැනීම අරමුණු කරගෙන පළාත් පේෂකර්මාන්ත අධ්‍යක්ෂවරුන් සහ සහකාර

අධ්‍යක්ෂවරුන් සඳහා වැඩමුළුවක් පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේදී පැවැත්වුණි.

*  අත්‍යන්ත්‍ර රෙදිපිළි තරගය හා ජාතික ප්‍රදර්ශනය

අත්‍යන්ත්‍ර පේෂකර්මාන්තයේ ගුණාත්මක බව වර්ධනය කිරීම සඳහා දේශීය හා විදේශීය වෙළඳපොල අරමුණු කොට දේශීය රෙදිපිළි නිර්මාණය කර අත්‍යන්ත්‍ර පේෂකර්මාන්ත ක්ෂේත්‍රයේ නියැලෙන්නන්ගේ හැකියාවන් ඔප් නැංවීම, දිරි ගැන්වීම හා ඔවුන්ගේ කුසලතා අගය කිරීම සඳහා ජාතික ප්‍රදර්ශනය හා සම්මාන උළෙල 2011 දෙසැම්බර් මස 17 දින සිට 24 දින දක්වා බණ්ඩාරනායක අනුස්මරණ ශාලාවේදී පැවැත්විණි. ප්‍රදර්ශන කුටි හා අලෙවි කුටිවලින් ප්‍රදර්ශනය සමන්විත වූ අතර රංගන, වාදන, නාට්‍ය වැනි සංස්කෘතික අංග වලින් ද ප්‍රදර්ශනය විචිත්‍රවත් විය.

## 5 සේවාස්ථ පුහුණු වැඩසටහන

I. පේෂකර්මාන්ත කළමණාකරුවන්, ව්‍යවසායකයින් හා උපදේශකයින් දක්වා විහිදී යන පරිදි පේෂකර්මාන්තයේ වර්ධනය සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන් හා වැඩමුළු සංවිධානය කිරීම හා ක්‍රියාත්මක කිරීම මේ යටතේ සිදුවේ.

පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය, පළාත් රාජ්‍ය, සමුපකාර, පෞද්ගලික අංශයේ අත්‍යන්ත්‍ර පේෂකර්මාන්ත ක්ෂේත්‍රයේ නියුතුවූවන්ගේ ඵලදායීතාවය වර්ධනය කිරීමේ අරමුණින් වාර්ෂික ක්‍රියාකාරී සැළැස්ම අනුව පාඨමාලා 12ක් පැවැත්වීම සඳහා සැළසුම් කර තිබූ අතර ඉන් 05ක් 2011 වර්ෂයේදී පවත්වන ලදි.

| <u>පුහුණු වැඩසටහන</u> | <u>ඉලක්කගත කණ්ඩායම</u> |
|---|---|
| 1. ඵලදායීතා පුහුණු වැඩසටහන | ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන් සඳහා |
| 2.රසවින්දනාත්මක හා ගුණාත්මක ආකල්ප වර්ධනය | පේෂ පාසල් සිසු සිසුවියන් සඳහා |
| 3 ස්වභාවික වර්ණ පුහුණු පාඨමාලාව | පළාත් සභා හා පෞද්ගලික අංශයේ ක්ෂේත්‍රයේ නියුතු වූවන් සඳහා |
| 4 ගුණාත්මක ආකල්ප ප්‍රවර්ධනය කිරීමේ | පේෂ පාසල් සිසුන් සඳහා |

වැඩසටහන

5 ආකල්ප,කුසලතා,පෞරුෂ වර්ධන, ශක්‍යතා පේෂ පාසල් සිසුන් සඳහා
වර්ධන වැඩසටහන

**6 වාර්ෂික පේෂකර්ම විභාගය පැවැත්වීම**

2011 වර්ෂයේදී පැවැත්වීමට නියමිතව තිබූ පේෂකර්මාන්ත දැඅවුරුදු පාඨමාලාවේ පළමු හා දෙවන වසර විභාග 2011 සැප්තැම්බර් මාසයේදී පවත්වන ලදි.

**7** ඉලක්කගත කර තිබූ පරිදි පේෂකර්මාන්ත පුහුණු පාසල් 12ක් සහ මෝස්තර ආයතන 2ක් සඳහා පරිගණක 14ක් මිලදී ගෙන ලබා දෙන ලදි.

**8** අත්යන්ත්‍ර පේෂකර්මාන්තය නගා සිටුවීම අරමුණු කර ගෙන පේෂකර්මාන්ත ක්ෂේත්‍රය පිළිඹිබු වන සේ විනාඩි 15ක ටෙලි නාට්‍යයක් නිෂ්පාදනය කර විකාශනය කරන ලදි.

**9** පේෂකර්මාන්ත පුහුණු පාසල් සඳහා අවශ්‍ය නූල් හා අත්යන්ත්‍ර උපකරණ මිලදී ගන්නා ලදි.

**10** පේෂකර්මාන්ත පුහුණු පාසල්වල පේෂකර්මාන්ත පුහණු පාඨමාලාව හදාරණ සිසුන් සඳහා පවත්වන ඉංග්‍රීසි පුහුණු පාඨමාලාව 2011 වර්ෂය තුළ සාර්ථකව ක්‍රියාත්මක කරන ලදි.

**11** පේෂකර්මාන්ත පුහුණු පාසල්හි ඉගෙනුම ලබන සියළුම සිසුන් සඳහා වසරකට නිල ඇඳුම් කට්ටල 02 බැගින් ලබා දෙන ලදි.